2027 වර්ෂය සඳහා සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීම

කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය

(කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාංශය)

කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය විසින් 2027 වර්ෂය සඳහා අවශ්‍ය වන භාණ්ඩ හා සේවා සැපයීම සඳහා සුදුසුකම්ලත් සැපයුම්කරුවන් තෝරා ගැනීමට අපේක්ෂා කෙරේ. ඒ අනුව, ශ්‍රී ලංකා රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය අනුව ලියාපදිංචි වීමට කැමති භාණ්ඩ සැපයුම්කරුවන්, සේවා සපයන්නන් සහ ආයතන වෙතින් අයදුම්පත් කැඳවනු ලැබේ.

ලියාපදිංචි විය හැකි කාණ්ඩ

ලියාපදිංචි වීම සඳහා පහත සඳහන් ප්‍රධාන කාණ්ඩ යටතේ අයැදුම් කළ හැකිය.

1. භාණ්ඩ සැපයීම

1.1 ගෘහ භාණ්ඩ සහ කාර්යාල උපකරණ (ලී බඩු, පුටු, මේස, ගොනු කබඩ්, අල්මාරි, රෙදි සෝදන යන්ත්‍ර, ගෑස් ලිප්, ශීතකරණ, රූපවාහිනී ආදී)

1.2 පරිගණක, පරිගණක උපාංග සහ විද්‍යුත් උපකරණ (ලැප්ටොප්, ඩෙස්ක්ටොප්, මුද්‍රණ යන්ත්‍ර, ස්කෑනර්, කැමරා, ප්‍රෝන යන්ත්‍ර, දුරකථන (ජංගම/ ස්ථාවර), ප්‍රොජෙක්ටර්, හැඳුනුම්පත් මුද්‍රණ යන්ත්‍ර, ටෝනර්, කාට්‍රිජ්, රිබන්, UPS ආදී)

1.3 මෘදුකාංග (වෛරස් ගාඩ්, විත්ඩෝස්, MS Office ආදී)

1.4 කාර්යාලයීය ලිපිද්‍රව්‍ය (පෑන්, පැන්සල්, ෆයිල්, කඩදාසි, ෆෝල්ඩර්, ආදී)

1.5 අනෙකුත් ලිපි ද්‍රව්‍ය (PVC හැඳුනුම්පත් කාඩ්පත් ආදී)

1.6 ඉදිකිරීම් ද්‍රව්‍ය (සිමෙන්ති, වැලි, ගල්, පස්, ලී, පයිප්ප, ආදී)

1.7 විද්‍යුත් උපකරණ (විදුලි බුබුළු, වයර්, ප්ලග්, ස්විච්, විදුලි පංකා, ආදී)

1.8 වාහන අමතර කොටස්, ටයර්, බැටරි සහ ලිහිසි තෙල්

1.9 ආහාර ද්‍රව්‍ය සහ සිල්ලර බඩු

1.10 රසායනික ද්‍රව්‍ය, ඖෂධ හා ෆාමසි ද්‍රව්‍ය

1.11 ජල පොම්ප සහ තල ළිං උපකරණ

1.12 රෙදිපිළි හා සැරසිලි නිෂ්පාදන

1.13 සනීපාරක්ෂක ද්‍රව්‍ය

1.14 ක්‍රීඩා උපකරණ

1.15 සත්ත්ව කන් සලකුණු (ගව, එළු, සූරතල් සතුන් හා වෙනත් සතුන් හඳුනා ගැනීම සඳහා ඉලෙක්ට්‍රොනික හා ඉලෙක්ට්‍රොනික නොවන)

2. සේවා සැපයීම

2.1 මුද්‍රණ සේවා (පොත්, දැන්වීම්, ආකෘති පත්‍ර, ආදී)

2.2 වාහන අලුත්වැඩියා සහ නඩත්තු සේවා

2.3 පරිගණක, සහ විද්‍යුත් උපකරණ අලුත්වැඩියා සේවා

2.4 AC පද්ධති අලුත්වැඩියාව

2.5 පරිගණක පද්ධති ජාලකරණය හා ආරක්ෂිත කැමරා සවි කිරීම්

2.6 ඡායාරූපකරණ සහ වීඩියෝකරණ සේවා

2.7 ගොඩනැගිලි නඩත්තු සහ අලුත්වැඩියා සේවා (විදුලි, ජලනළ, ගෙවතු අලංකරණ, වහල, පාටිෂන් වැඩ ආදී)

2.8 සුළු ඉදිකිරීම් කටයුතු (අලුත්වැඩියා සහ නඩත්තු)

2.9 ආරක්ෂක සහ පිරිසිදු කිරීමේ සේවා

2.10 වැඩසටහන් සහ උත්සව සංවිධාන සේවා

2.11 ගමන් පහසුකම් (වාහන කුලී සේවා)

අයැදුම් කිරීමේ ක්‍රියාවලිය

i. සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීමේ මුද්‍රිත අයදුම්පත ආයතනයේ ප්‍රධාන කාර්යාලයෙන් හෝ www.aib.gov.lk වෙබ් අඩවියෙන් ලබාගත හැකිය.

ii. එක් අයිතමයක් සඳහා සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීමේ ආපසු නොගෙවන ගාස්තුව රුපියල් 2,000/- කි. සෑම අයිතම අනු අංකයක් (1.1 සිට 2.11 දක්වා) සඳහාම වෙන් වෙන් වශයෙන් ගාස්තු ගෙවා මුද්‍රිත අයැදුම් පත්‍රයක් යොමුකර ලියාපදිංචි විය යුතුය.

iii. ගාස්තුව මෙම ආයතනයේ මුදල් අංශය වෙත ගෙවා ලබාගත් රිසිට් පතෙහි මුල් පිටපත හෝ සභාපති, කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය නමින් ලියන ලද චෙක්පත හෝ සමඟ අයදුම්පත ඉදිරිපත් කළ යුතුය.

iv. අයදුම්පතේ අඩංගු සියලු තොරතුරු නිවැරදි විය යුතු අතර, අවශ්‍ය ලේඛන (ව්‍යාපාර ලියාපදිංචි සහතිකය, TIN, VAT සහතිකය, පසුගිය වර්ෂයේ ගිණුම් ප්‍රකාශනය ආදී) සමඟ ඉදිරිපත් කළ යුතුය.

v. අසම්පූර්ණ හෝ අවශ්‍ය ලේඛන අමුණා නොමැති අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

vi. https://forms.gle/n9ftdwkcPu66KPNi9 මෙම දිගුව භාවිතා කර හෝ පහත දක්වා ඇති QR කේතය භාවිතා කර අයදුම්පත්‍රය හි සඳහන් කරන ලද තොරතුරු **ඉංග්‍රීසි භාෂාවෙන් පමණක්** නිවැරදිව ඇතුළත් කරමින් Google Form සම්පූර්ණ කිරීම අනිවාර්යය වේ. (එක් අයදුම්කරුවෙකු අයිතම අනු අංක කිහිපයක් යටතේ අයදුම්පත් යොමුකළ ද අයදුම්පත්‍රයේ "අංක 4. අයදුම් කරන කාණ්ඩය" යටතේ කරුණු පමණක් වෙනස් වන්නේ නම් එක් අවස්ථාවක් පමණක් අදාළ Google Form සම්පූර්ණ කිරීම ප්‍රමාණවත් වේ.)

vii. සම්පූර්ණ කරන ලද අයදුම්පත් 2026.11.17 දින පස්වරු 03.00 ට හෝ ඊට ප්‍රථමයෙන් පහත සඳහන් ලිපිනය වෙත ගෙනවිත් භාර දීම හෝ ලියාපදිංචි තැපැලෙන් යොමු කිරීම කළ යුතුය. අයදුම්පත් යොමු කරන ලිපි කවරයේ ඉහළ වම් කෙළවර **"සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීම - 2027"** යනුවෙන් සඳහන් කළ යුතුය.

කොන්දේසි සහ රෙගුලාසි

i. සැපයුම්කරුවන්ට භාණ්ඩ හා සේවා ඇණවුම් ලබාදීමේදී ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අනුව සුදුසුකම් සලකා බැලෙනු ඇත.

ii. භාණ්ඩ හා සේවා මිලදී ගැනීම් සඳහා අවම වශයෙන් දින 30ක ණය කාල සීමාවක් ලබා දිය යුතුය

iii. අත්තිකාරම් ලබා දීම හෝ භාණ්ඩ/ සේවා නියමිත පරිදි ආයතන වෙත භාර දීමට ප්‍රථම ව ගෙවීම් සිදු කරනු නොලැබේ.

iv. ලියාපදිංචි වීම පමණක්, භාණ්ඩ හා සේවා ඇණවුම් ලබාදීමට සහතිකයක් නොවේ.

v. අවශ්‍යතාව මත ලියාපදිංචි සැපයුම්කරුවන්ගෙන් පරිබාහිරව මිලදී ගැනීමේ අයිතිය ආයතනය සතුය.

vi. ලියාපදිංචි වූ සැපයුම්කරුවන්ගේ ලැයිස්තුව ප්‍රසිද්ධ කරනු ලබන අතර, මෙම ලැයිස්තුව වසරක් සඳහා වලංගු වේ.

vii. මිල ගණන් කැඳවීමේ දී අවස්ථා 03කට වැඩි ප්‍රතිචාර නොදක්වන / සක්‍රිය ලෙස සහභාගි නොවන අයදුම්කරුවන් ලැයිස්තුවෙන් ඉවත් කිරීමට කටයුතු කරනු ලැබේ.

viii. ඕනෑම අවස්ථාවක අයදුම්පත් ප්‍රතික්ෂේප කිරීමේ හෝ ලියාපදිංචිය අවලංගු කිරීමේ අයිතිය ආයතනය සතුය.

ix. වැඩි විස්තර සඳහා කාර්යාල වේලාවන් (සඳුදා සිට සිකුරාදා, පෙ.ව.8.30 සිට පස්වරු 4.00) තුළ දී ප්‍රධාන කාර්යාලය හා සම්බන්ධ වන්න.

සභාපති, කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය,
අංක 117, සුභද්‍රාරාම මාවත, ගංගොඩවිල, නුගේගොඩ.
දුරකථන : 0112-384000
වෙබ් අඩවිය : www.aib.gov.lk
email : supply@aib.gov.lk
දිනය: 2026.11.03